යම් කිසි වරදක් කාන්තාවකගේ සහ පිරිමියෙකුගේ දායකත්වයෙන් සිදුවූ විට, ඒ වරද පිළිබඳව කාන්තාව දැරිය යුතු වගකීම, එම සමාන වරදම සිදුකරන පිරිමියා ඒ පිළිබඳව දැරිය යුතු වගකීමට වඩා වැඩිද? එසේ නොවේ නම්, බොහෝ පුවත් වාර්තාවල එකම වරද සිදුකරනා කණ්ඩායමකින් කාන්තාව පමණක් ඉස්මතු කොට පෙන්වන්නේ කුමන පදනමකින්ද? මේවා පාඨක අප විසින් කාන්තාව කොන් කිරීම වැළැක්වීම සඳහා ඇසිය යුතු ප්‍රශ්න වෙයි.

උදාහරණ ලෙසින් පහත දැක්වෙන මව්බිම (03/12), දිනමිණ (03/12) සහ ලංකාදීප (03/18) පුවත් වාර්තාවන් ගනිමු. මේවායේ සඳහන් වන්නේ "කාන්තාවන් තිදෙනෙක් ඇතුළු පහළොවක්", "කතක් ඇතුළු තිදෙනා" යන ආකාරයන්ගෙනි. කෙසේ නමුත් ලංකාදීප පුවතේ අන්තර්ගතයේ "කාන්තාව සහ පිරිමියා" යනුවෙන් සඳහන් වී තිබෙනු නිරීක්ෂණය කළ හැක.

මෙසේ සෘණාත්මක සන්දර්භයන් තුළ කාන්තාව පමණක් ඉස්මතු කිරීම ඔස්සේ සිදුවන්නේ, කාන්තාවක් සිදුකරනා වරදක බරපතළ බව පිරිමියෙකු සිදුකරනා එම වරදේම බරපතළ බවට වඩා වැඩි යැයි හැඟවීමකි. එය කාන්තාව කොන් කිරීමකි. කාන්තාව කොන් කරනා එවැනි වාර්තාකරණයක් මාධ්‍ය ආචාර ධර්මයන්ට පටහැණි නොවන්නේදැයි අප මෙම මාධ්‍යයන්ගෙන් නැවත නැවත ඇසිය යුතුයි.

#MediaEthicsSL #lka #SinhalaPress #Mawbima #Dinamina #Lankadeepa